**නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අ‍ෙප්‍රල් 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නාවිදන්වෙලි ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයේ කපා හරිනු ලැබූ 2006 වර්ෂයට අදාළ ශේෂයක්ව පැවති මස් කඩ හිඟ ශේෂය රු.1,235,677 සමුච්චිත අරමුදෙලන් අඩු නොකර ලැබීම් ගෙවීම් ගිණුමෙන් සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායමෙන් අඩුකර දැක්වීමෙන් වර්ෂයට අදාළ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 ලැබිය යුතු ගිණුම්**

2001 වර්ෂයට පෙර ස්ථාන මාරු වී ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ ණය රු.42,669 ක ශේෂය අයකර ගැනීමට හෝ ගිණුම්වලින් කපාහැරීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පාලනය විධිවිධාන පරිච්ඡේදයේ 5 (XII) රීතිය | - | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම යනාදී කාර්යයන් රාජකාරීමය වශයෙන් පවරා තිබුණු නිලධාරීන් තිදෙනෙකුගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 62,823 | වර්ෂ 02 ක් ඉක්ම වූ ඉකුත් තැන්පතු 17 ක් සම්බන්ධයෙන් සභාව ක්‍රියාමාර්ග කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,179,304 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,623,162ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,443,858ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

### 2.2 ආදායම් පරිපාලනය

-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම්

------------------------------------------------------------

ඉදිරිපත් කරනු ලැබූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට සහ පසුගිය වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම් | රැස් කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් හා බදු | -- | -- | -- | -- | 15 | - | -- | -- |
| කුලී | 2,856 | 2,870 | 2,593 | 1,510 | 2,210 | 2,136 | 1,788 | 2,470 |
| බලපත්‍ර ගාස්තු | 485 | 426 | 426 | -- | 310 | 424 | 424 | -- |
| අනෙකුත් ආදායම් | 6,592 | 5,940 | 4,269 | 1,671 | 5,952 | 5,191 | 5,013 | -- |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකරගත යුතු රු.11,182,662 ක ආදායමෙන් සමාලෝචිත වර්ෂයේදී රු.7,288,370 ක් අයකරගෙන තිබුණි. මේ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 65% ක්ව පැවතුණි.

#### 2.2.3 වරිපනම් හා බදු

------------------

1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ස්ථානවල ඇති ව්‍යාපාර ආයතන 324 ක් සහ නිවාස 6,049 ක් මත වරිපනම් තක්සේරු කර ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීම නිසා වාර්ෂිකව ආසන්න වශයෙන් රු.3,200,000 ක ආදායමක් අහිමි කරගැනීමට සිදු වී තිබුණි.

**2.2.4 මස්කඩ හිඟ බදු**

---------------------

2007 සිට 2012 දක්වා කාලපරිච්ඡේදය සඳහා අයකරගත යුතු රු.1,234,304 ක හිඟ මස් කඩ බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාව විසින් 2017 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව මහජන පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම සඳහා රු.250,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. සමාලෝචිත වර්ෂයේ රු.91,886 ක් වටිනා පොත් පමණක් මිලදී ගෙන තිබූ නමුත් පාඨකයින්ගේ අවශ්‍යතාවය හඳුනාගෙන පොත් මිලදී ගෙන නොතිබුණි.

(ආ) පුස්තකාල ක්‍රියාකාරම් වැඩිකර පාඨකයින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා පුස්තකාල සංවර්ධන කමිටුවක් ප්‍රාදේශීය සභාව විසින් පිහිටුවා තිබුණි. මෙම කමිටුව 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රැස්වීම් 05 ක් පමණක් පවත්වා තිබූ අතර, පුස්තකාලයේ දියුණුව මෙන්ම පාඨකයින් විසින් පුස්තකාල භාවිතයද මන්දගාමී මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

**3.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය**

--------------------

**3.2.1 ළමා උද්‍යාන ක්‍රීඩා භාණ්ඩ ප්‍රසම්පාදනය**

----------------------------------------

පළාත් සභා සාමාජිකයා විසින් වෙන් කරනු ලැබූ පරිත්‍යාග යටතේ 2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මධ්‍යම කඳවුරු ප්‍රදේශයේ ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා රු.400,000 ක් **ඇස්තමේන්තු කර ක්‍රීඩා භාණ්ඩ** මිලදීගෙන සවිකිරීම් සිදු කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව විසින් ක්‍රීඩා උපකරණ විකුණුම් ආයතනවලින් මිලදී ගැනීම් සිදු නොකර කොන්ත්‍රාත් පදනම මත මිලදී ගැනීම නිසා, ඇස්තමේන්තුවෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර රු.96,388 ක එනම් සියයට 14 ක ලාභය සහ සියයට 15 ක වැට් බදු ඇතුළත් වීම හේතුවෙන් අදාළ ඇස්තමේන්තුව මඟින් මිලදී ගැනීමට හැකිව තිබූ එක් ක්‍රීඩා භාණ්ඩයක් අහිමි කරගෙන තිබුණි.

(ආ) සභාව විසින් මෙම ක්‍රීඩා භාණ්ඩ කොන්ත්‍රාත් පදනමින් රු.353,322 කට මිලදී ගෙන ස්ථාපිත කර තිබුණත් සභාව විසින් ඉදිරිපත් කළ ඡායාරූපයේ පැවැති මාදිලියට අනුව මිලදී ගැනීම් සිදුකර නොතිබුණි. එසේ වුවත්, සභාව විසින් ඉදිරිපත් කරනු ලැබූ මාදිලියට අනුව උපකරණ තිබූ බවට තාක්ෂණික නිලධාරී විසින් නිර්දේශ කර ගෙවීම් අනුමත කර තිබුණි.

### 3.2.2 ඇඹිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 මාර්ගෝපදේශය අනුව තරඟකාරී නොවන වාතාවරණයකදී පමණක් සෘජු ගිවිසුම් මඟින් ප්‍රසම්පාදනය කළ හැකි නමුත් ඉහත සඳහන් හේතූන් නොමැතිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර සෘජු ගිවිසුම් මඟින් සීමා සහිත ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් රු.92,862 කට ඇඹිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙන තිබුණි. එසේ වුවත්, අනෙකුත් සභාවන් විසින් මෙම වර්ගයේම ඇඹිලි සලකුණු යන්ත්‍ර රු.51,500 කට මිලදී ගෙන තිබූ බැවින් සභාව විසින් රු.41,362 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

### 3.2.3 මහජන පුස්තකාලයට ලී බඩු මිලදී ගැනීම

2017 වර්ෂයේ පළාත් සභා විමධ්‍යගත සංවර්ධන වැඩසටහන යටතේ නාවින්දවෙලි මහජන පුස්තකාලයට ලී බඩු මිලදී ගැනීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මෙම භාණ්ඩ ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් මිලදී ගෙන තිබූ අතර මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක් මත සෘජු කොන්ත්‍රාත් මඟින් භාණ්ඩ මිලදී ගෙන තිබුණත්, මාස 14 ක් කල් ඉකුත් වී තිබුණත් අදාළ අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) 2017 ජුනි 27 දින සැපයුම්කරුවන්ට ලබාදුන් මිලදී ගැනීමේ අණවුම් ප්‍රකාර වර්ග 18 ක ලී බඩු 130 ක් 2017 දිනට ප්‍රථම සැපයිය යුතු වුවත්, 2017 අගෝස්තු මාසයේ අයිතමයන් 91 ක්ද 2017 ඔක්තෝබර් මාසයේ අයිතමයන් 04 ක් සහ 2017 නොවැම්බර් මාසයේ අයිතම 23 ක්ද සපයා තිබුණි.

(ඇ) මිලදී ගනු ලැබූ ලී බඩුවලින් වර්ග 10 කට අයත් ලී බඩු අයිතමයන් 68 ක මිල ගණන් පිළිබඳව අදාළ භාණ්ඩ නිෂ්පාදන ආයතනවල මිල දර්ශක සමඟ පරීක්ෂා කිරීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර සෘජු කොන්ත්‍රාත් මඟින් මිලදී ගැනීම් නිසා සභාව විසින් රු.68,371 ක් අහිමි කරගෙන තිබුණි.

### 3.2.4 මාර්ගවලට කොන්ක්‍රීට් දැමීම සහ ඇල මාර්ග ඉදිකිරීම

සමාලෝචිත වර්ෂයේ නගර සැලසුම් හා ජල සම්පත් අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මාර්ගයට කොන්ක්‍රීට් දැමීම සහ ඇල මාර්ග ඉදිකිරීම සඳහා සභා බල ප්‍රදේශයට අයත් GMMS පාසල් මාර්ගයට රු.මිලියන 2.7 ක් සහ මෝදිනාර් (Mordinar) මාර්ගයට රු.මිලියන 3.3 ක්ද ප්‍රතිපාදන සලසා ඉදිකිරීම් කාර්යයන් නිමකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) GMMS පාසල් මාර්ගය ඉදිකිරීම් කර්මාන්තය සඳහා රු.159,159 ක් වටිනාකමැති කොන්ක්‍රීට් කුඩු 2018 අගෝස්තු 31 දින වන විටත් දමා නොතිබූ නමුත් මේ සඳහා ගෙවීම් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) 2018 අගෝස්තු 31 දින වන විටත් මෝදිනාර් මාර්ගය ඉදිකිරීම් කර්මාන්තයේ රු.430,590 ක වටිනාකමට අනුමත තත්ත්වයේ පස් යොදා ගල්රෝල මඟින් මට්ටම් කර උසස් තත්ත්වයේ කොන්ක්‍රීට් කුඩු ඉසීම වැනි කාර්යයන් සිදුකර නොතිබූ නමුත් මෙම කාර්යයන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඝන අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම්. |
| (ඈ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | භාණ්ඩවල මිල වනාහි සාධාරණ සහ සන්සන්දනය කළ හැකිව පැවතීම |